# ඇබෑර්තු

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

### වාරිමාර්ග අමාත්‍යාංශය

තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා පූර්ණකාලීන කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා, යථා පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළත්ව සකස් කළ අයදුම්පත්, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සහිතව, පහත සඳහන් ලිපිනය වෙත, ලියාපදිංචි තැපෑලෙන්, 2022 මාර්තු 22 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය,**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුව,**
**කන්දකැටිය.**
**(දුරකතනය – 0552245626)**

### 01. ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) - තනතුරු 01 (PS 4A හෝ 4B වර්ගීකරණය)

අ.) PS4 වර්ගීකරණය A සඳහා සුදුසුකම් – වැටුප් පරාසය : රුපියල් 135,000.00 – 150,000.00

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්,

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, ආශ්‍රිත සාමාජිකත්වය / අදාළ ක්ෂේත්‍රයේ සමාන වෘත්තීය සුදුසුකම්,

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වසර 08 ක පළපුරුද්ද.

2) රජයේ දීපව්‍යාප්ත සේවයේ III / II පංතිය හෝ ඉන් ඉහළ තනතුරක නිලධාරියකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්,

**සමග**

III / II පංතිය තනතුරක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

**ආ.) PS4 වර්ගීකරණය B සඳහා සුදුසුකම් – වැටුප් පරාසය – රුපියල් 110,000.00 – 120,000.00**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්,

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, ආශ්‍රිත සාමාජිකත්වය / අදාළ ක්ෂේත්‍රයේ සමාන වෘත්තීය සුදුසුකම්,

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වසර 06 ක පළපුරුද්ද.

### 02. තාක්ෂණ නිලධාරී - තනතුරු 01 (PS 6A හෝ 6B වර්ගීකරණය)

අ.) PS6 වර්ගීකරණය A සඳහා සුදුසුකම් – වැටුප් පරාසය : රුපියල් 64,000.00 – 69,000.00

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්,

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, ආශ්‍රිත සාමාජිකත්වය / අදාළ ක්ෂේත්‍රයේ සමාන වෘත්තීය සුදුසුකම්,

**හෝ**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු, තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා වූ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

2) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කළ, තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබාතිබීම.

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

3) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

**ආ.) PS6 වර්ගීකරණය B සඳහා සුදුසුකම් – වැටුප් පරාසය – රුපියල් 55,000.00 – 57,000.00**

1) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කළ, තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම,

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද.

**හෝ**

2) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද.

**හෝ**

3) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 11 ක පළපුරුද්ද.

### 03. සංවර්ධන නිලධාරී (සහායක කාර්ය මණ්ඩලය)

සංවර්ධන නිලධාරී සඳහා සුදුසුකම් – වැටුප : රුපියල් 47,235.00

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ උපාධියට සමාන සුදුසුකම්

**පොදු කොන්දේසි :**

1. අයදුම්කරු වයස අවුරුදු 62 කට අඩු අය විය යුතුය.
2. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් යෙදූ ව්‍යාපෘතිවල / සංවර්ධන ව්‍යාපෘතිවල කාර්ය පළපුරුද්ද අමතර වාසිදයක වනු ඇත.
3. මෙම තනතුරු සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාවය, රජයේ රෙගුලාසිවල හුරුපුරුදුතාවය හා පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය වේ.
4. රජයේ අනුමත වැටුප් පරිමාණයන් හා අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා ඉන්පසුව කෙරුණු සංශෝධන ප්‍රකාරව වන ගෙවීම් අදාළ වේ. (පිවිසෙන්න - http//www.treasury.gov.lk)
5. මෙම පත්කිරීම්, මූලිකව වසර 01 ක් සඳහා කොන්ත්‍රාත් පදනමින් සිදු කරනු ලබන අතර, නිලධාරියාගේ කාර්ය සාධනය හා ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත සේවා දීර්ඝ කිරීම සිදුකිරීමට අවකාශ ඇත.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්, ඔවුන්ගේ ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, තෝරාගැනීම කුසලතා මත සිදු කෙරේ. එසේ හෙයින්, තෝරා ගැනීමේ ක්‍රමවේදයට යම් බලපෑම් කිරීම හෝ යම් නියෝජන ඉදිරිපත් කිරීම් සිදු කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හේතුවනු ඇත. මූලික සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල / සංස්ථාවල හා අනෙකුත් රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය. ඔවුන් විසින් මෙම අයදුම්කරු නව තනතුරට පූර්ණකාලීන තෝරා ගනු ලැබුවහොත්, දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණු සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**

**2022-02-24**